# සමකාලීන සමාජ සැකැස්මේ වාස්තුවිද්‍යාත්මක නිරූපණය; මහනුවර පාතහේවාහැට ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථානගත වී ඇති අම්බලම් පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

ටී.එච්.පී.ඒ.කේ. ජයසූරිය[37]

---

අම්බලම යන වචනය හා ඒ හා බැඳී පවතින වාස්තුවිද්‍යාත්මක නිර්මාණය නූතන සමාජ ක්‍රමය තුළ ගරා වැටුණු අබලන් වූ යාචකයින් හා සතුන් ලගින ස්ථානයක් වශයෙන් පිළිගනු ලැබුව ද ශ්‍රී ලාංකේය අතීත ගැමි සමාජය තුළ අම්බලම සමකාලීන සමාජ, ආර්ථික, දේශපාලන මෙන්ම ආගමික තත්ත්ව සමඟින් බැඳී, වැදගත් වූ නිර්මාණයක් මෙන්ම සමකාලීන ගැමි සමාජයේ කේන්ද්‍රස්ථානයක් වශයෙන් පවතින්නට ඇත. වර්තමානය වන විට ලංකාව තුළ පැවති අම්බලම් විනාශ වී පැවතීම, එහි උපයෝගීතාව හීන වීම හා ඒවා පිළිබඳව සිදු කර ඇති පර්යේෂණ හා ඒවායේ වාර්තා ප්‍රමාණවත් නොවීම නිසාවෙන් මෙ රට අම්බලම් ඉදිකිරීමේ ආරම්භක කාලය හා ඒවායේ පැවති මුල් ස්වරූපය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට නොහැකි වී ඇත. මහනුවර රාජධානි සමයේ ඉදි කරනු ලැබූ අම්බලම් අතුරින් බොහෝ ප්‍රමාණයක් දිවයිනේ විවිධ ප්‍රදේශ වල ව්‍යාප්තව පවතින අතර එම ශ්‍රේෂ්ඨ නිර්මාණ අනුව අම්බලම පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, වාස්තුවිද්‍යාත්මක, කලාත්මක, ආගමික, සාමාජීය... ආදී විවිධ අගයන්ගෙන් සමන්විත නිර්මාණයක් වශයෙන් හඳුනාගතහැකි අතර එවන් අගයන් වලින් පරිපූර්ණ වූ පැරණි අම්බලම් කිහිපයක් මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවාහැට ප්‍රා. ලේ. කො.ය තුළින් හඳුනාගැනීමට හැකි වේ. මෙම ප්‍රදේශය කන්ද උඩ පස්රටින් එක් රටක් වූ හේවාහැටේ එගොඩතිහ හෙවත් පාතහෝවාහැට කලාපය වශයෙන් ගම්පළ යුගයේ පටන්ම වැදගත් වී ඇති අතර එම කලාපයේ ඓතිහාසික වැදගත්කම අනුව කලාපීය සමකාලීන සමාජ ක්‍රමය තුළ නිර්මාණය වී ඇති අම්බලම් වල පිහිටීම, ඓතිහාසික, පුරාවිද්‍යාත්මක, වාස්තුවිද්‍යාත්මක, කලාත්මක වැදගත්කම හා අම්බලම් හා බද්ධව පැවති පැරණි මාර්ග ජාලයන්, සමකාලීන සමාජ, ආර්ථික, දේශපාලනික තත්ත්වයන් ආදිය පිළිබඳවඅධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ. හේවාහැට කලාපය තුළ මාරස්සන ගම මැද අම්බලම, කන්දේවෙළ පුරාණ අම්බලම, ගොඩමුන්න අම්බලම.... ආදී පුරාණ අම්බලම් දහයකට ආසන්න ප්‍රමාණයක් හඳුනාගැනීමට හැකි වූ අතර ඒවා පිළිබඳව විවිධ ද්වීතික මූලාශ්‍ර, ප්‍රදේශ වාසීන්ගෙන් හා ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් රැස් කරනු ලැබූ තොරතුරු අනුව මෙම අම්බලම් මහනුවර රාජධානි සමයේ දී භාවිත කරන ලද පැරණි මාර්ග හා මුරපොළවල් කේන්ද්‍ර කර ගනිමින් ඉදි කර ඇති බවත් ඒ ඒ අම්බලම් විවිධ අවස්ථා වලදී අයබදු එකතු කිරීම්, නඩු ඇසීම්, ගම් සභාව පැවැත්වීම, දළදාව ප්‍රදර්ශනය කිරීම හා වෙනත් ආගමික උත්සව උදෙසා යොදා ගැනීම, කැරලි අවස්ථා වල දී ඉංග්‍රීසීන් තම ලැගුම්හල් වශයෙන් භාවිත කිරීම... ආදී විවිධ සමාජ, ආර්ථික, දේශපාලන හා ආගමික සිදුවීම් හා අවස්ථා සමඟ සම්බන්ධ වී ඇති නිසාවෙන් හේවාහැටේ අම්බලම් තත්කාලීන සමාජ ක්‍රමයේ වාස්තුවිද්‍යාත්මක හා කලාත්මක නිරූපණයන් වශයෙන් වැදගත් වන බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද: හේවාහැට අම්බලම්, අම්බලම්හි වාස්තුවිද්‍යාව, සමකාලීන සමාජය

---

[37] පුරාවිද්‍යා හා උරුමකළමනාකරණ අධ්‍යයනාංශය,ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,Anushajayasooriya1@gmail.com.